විද්‍යාලය :- තෙප්පනාව කුමාර මහා විද්‍යාලය

සිංහල භාෂාව හා සාහිත්‍යය :- 12 ශ්‍රේණිය පැවරුම්

පුරාතන ගද්‍ය සාහිත්‍යය :- සද්ධර්මාලංකාරය (ස්වර්ණතිලකා කතා වස්තුව )

පහත ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න ?

එකල්හි පළමු කළ ප්‍රාර්ථනා වූ පරිද්දෙන් විශිෂ්ට වූ රූ ඇති වූහ.ඔවුන්ගේ සියලඟින් විදුලිය කලඹක් වැනි රශ්මි මාලා සමූහයෝ නික්මෙති.හාත්පසින් සතරරියන් පමණ තන්හි ශරීරාලෝකයෙන් ම අන්ධකාර දුරුව ඒකාලෝක වෙයි.මුඛයෙන් මහනෙල් මල් සුවඳ හමා බස්සී.ශරීරයෙන් සඳුන් සුවඳ වහනය වෙයි.ඔවුන් දෙතන මැද රන්වන් වූ **<u>තිලකාභරණයෙක්</u>** මැවිණ.ඒ තිලකා භරණයෙන් අභිනව **<u>බාලාර්කමණ්ඩලයක්</u>** සේ රශ්මි සමූහයෝ නික්මෙති.ඒ කුමාරිකාවන් දුටු දුටු පුරුෂයෝ බොහෝ සේ ම උමතුවෙන් මෙන් කාමයෙන් මත් ව විසංඥ වෙති.අහෝ කුසලාකුසල වාක් කර්මයන්ගේ ආනුභාව නම් ඉතා නො සිතිය හැක්කේය.

1. මෙහි විස්තර කෙරෙන තැනැත්තිය කෙබඳු අයෙක්ද ?
2. ඉරි ඇඳි පද සඳහා අර්ථය ලියන්න ?
3. මුඛයෙන් යන්නෙහි ව්‍යාකරණ විභාග දක්වන්න ?
4. මෙහි එන උපමාවක් දක්වන්න ?